# මුදල් අමාත්‍යාංශය
# රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය

PROMISe

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) නිලධාරීන් බඳවා ගැනීම (තනතුරු 03)

රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලයේ (e-GP Secretariat), හි පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) නිලධාරී තනතුරු සඳහා යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින්, (මුදල් අමාත්‍යාංශයේ, රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා) මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**මාසික ඉපැයීම්** : (සියල්ල ඇතුළත්ව) රු. 40,000/-

**වයස් සීමාව** : අවුරුදු 50 ට අඩු

**සුදුසුකම් :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ සමාන සුදුසුකම්

හෝ

2) අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකම්

හෝ

3) තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත්, ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු සහතිකයක් සහ අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද.

LAMP Platform සඳහා වෙබ් පාදක මෘදුකාංග සංවර්ධනය පිළිබඳ පළපුරුද්ද සහිත සහ User-Interface Desigs, System Testing and Documentations Under Agile පිළිබඳ මනා දැනුමක් සහිත අපේක්ෂකයින් හට, ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. පද්ධති ආරක්ෂණය සහ රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු දැනුම අමතර වාසියක් වනු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

අදාළ සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ පදනම :**

සියලුම පත්වීම් මූලිකව එක් වසරක කාලසීමාවක් සඳහා වනු ඇති අතර, සේවයේ දීර්ඝ කිරීම කාර්ය සාධනය මත පදනම්ව සිදුවනු ඇත.

**නියමයන් හා කොන්දේසි :**

2019-03-15 දතම හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ සහ ඒ අනුගාමී භාණ්ඩාගාර චක්‍රලේඛයන් හි අඩංගු සියලු කොන්දේසි, මෙම පත්වීම් සඳහා අදාළ වනු ඇත.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV), 2022-03-28 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට පමණක් ලැබෙන සේ ඊමේල් මගින් අයදුම්කරුගේ යෝග්‍යතාව සනාථ කිරීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපනික හා වෘත්තියවේදී සුදුසුකම් හා පළපුරුද්ද විදහා දක්වමින් ඉදිරිපත් කළ යුතුය.

egphr@promise.lk

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය,**
(e-GP Secretariat)
**2 වන මහල, නව ගොඩනැගිල්ල, මුදල් අමාත්‍යාංශය.**

**2022-03-20**